# 03 අක්ෂර මාලාව

**කියවීම හා ලිවීම යන භාෂා කාර්යයන්හි දී අක්ෂර මාලාව පිළිබඳ නිවැරදි දැනීම අත්‍යවශ්‍ය ය. නිවැරදි අක්ෂර වින්‍යාසය, අකාරාදි පිළිවෙළ ආදි කොට ඇති විවිධ භාෂා කටයුතු සඳහා බෙහෙවින් උපකාරී වන්නේ අක්ෂර මාලාව පිළිබඳ දැනීම ය.**

**නූතන සිංහල අක්ෂර මාලාව ගැන මනා අවබෝධයක් ලබා ගැනීමට මේ පාඩම ඉවහල් වනු ඇත.**

කථන ව්‍යවහාරය හා ලේඛන ව්‍යවහාරය යනුවෙන් සිංහල භාෂාවේ ව්‍යවහාර දෙකක් පවතී. කථන ව්‍යවහාරයේ දී ශබ්ද රටා ශ්‍රව්‍ය ගෝචර ලෙස භාවිත කරනු ලබන අතර ලේඛන ව්‍යවහාරයේ දී ශබ්ද රටා දෘෂ්ටි ගෝචර ලෙස සංකේතවත් කරනු ලැබේ. මේ ශබ්ද සංකේතවත් කිරීම සඳහා භාවිත කරන රූප හෙවත් සංකේත, අක්ෂර ලෙස හැඳින්විය හැකි ය.

මේ සංකේත සමූහය අක්ෂර මාලාව, වර්ණ මාලාව, හෝඩිය යන නම්වලින් ද හැඳින්වේ.

**පහත දැක්වෙන්නේ නූතන අක්ෂර මාලාව යි. එහි අක්ෂර 60කි.**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

එය ශබ්ද නගා නිවැරදි උච්චාරණය සහිත ව කියවන්න.

නූතන සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව වැදගත් කරුණු කිහිපයක් අවධාරණය කරමු.

- නූතන සිංහල අක්ෂර මාලාවෙහි 'අ' සිට 'ඖ' දක්වා තිබෙන අකුරු ස්වර, නමින් හැඳින්වේ. ඒවා පණකුරු හෙවත් ප්‍රාණාක්ෂර නමින් ද ව්‍යවහාර වේ. මේ ස්වර සංඛ්‍යාව 18කි. තනි ව ශබ්ද කළ හැකි මේ ස්වර හෙවත් ප්‍රාණාක්ෂර කොටස් දෙකකි. එනම් "**හ්‍රස්ව**" හා "**දීර්ඝ**" වශයෙනි.

කෙටි කාලයකදී උසුරුවන ස්වර ශබ්ද හ්‍රස්ව වේ.
උදා: අ ඇ ඉ උ එ ඔ ඍ ඏ

දිගු කාලයකදී උසුරුවන ශබ්ද දීර්ඝ වේ.
උදා: ආ ඈ ඊ ඌ ඒ ඓ ඕ ඖ ඎ ඐ

- '**ක**' සිට '**ෆ**' දක්වා තිබෙන අකුරු **ව්‍යඤ්ජන** හෙවත් **ගාත්‍රාක්ෂර** ලෙස හැඳින්වේ. මේවා ගතකුරු, හල් අකුරු , යනුවෙන් ද ව්‍යවහාර වේ. එකී අකුරු ගණන 42කි. (භාවිතයේ පහසුව සඳහා හල් අකුරු හල් සලකුණ නොමැති ව දක්වා ඇත.)

- **ගාත්‍රාක්ෂර අතර අල්පප්‍රාණ** යනුවෙන් හැඳින්වෙන උච්චාරණයේ දී අඩු ශ්වසනයකින් යුතු වූ අකුරු දහයකි. ඒවා පහත දැක්වේ.

| | |
|---|---|
| ක | ග |
| ච | ජ |
| ට | ඩ |
| ත | ද |
| ප | බ |

**මහාප්‍රාණ** අක්ෂර ලෙස හැඳින්වෙන අකුරු ද දහයකි.
මහාප්‍රාණ අක්ෂර පහත දැක්වේ.

| | |
|---|---|
| ඛ | ඝ |
| ඡ | ඣ |
| ඨ | ඪ |
| ථ | ධ |
| ඵ | භ |

මහාප්‍රාණ අක්ෂර යෙදුණු වචන 10ක් පහත දක්වා ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| ඛ | . | **ඛනිජ** | ඝ | . | **ඝෝෂාව** |
| ඡ | . | **ඡායාව** | ඣ | . | **ගිජ්ඣකූට** |
| ඨ | . | **පාඨය** | ඪ | . | **ප්‍රෞඪ** |
| ථ | . | **අර්ථය** | ධ | . | **ධාර්මික** |
| ඵ | . | **ප්‍රතිඵල** | භ | . | **භස්ම** |

- **නාසික්‍ය අක්ෂර** ලෙස හැඳින්වෙන්නේ උච්චාරණයේ දී නාස් කුහරය විවෘත ව පවතිද්දී ඒ ඔස්සේ වාතය ගමන් කරන විට කියවෙන ශබ්ද වේ. නාසික්‍ය අක්ෂර පහත දැක්වේ.

  **ඞ ං ඤ ඥ න ණ ම**

  උදා - ලඞ්කාව, බිංදුව, රතිඤ්ඤා, ඥානය, පවන, ණය, මල

- **ඌෂ්මාක්ෂර** යනුවෙන් හැඳින්වෙන්නේ උච්චාරණයේ දී උණුසුම් වායුධාරාවක් පිටවන අකුරුයි. ඌෂ්මාක්ෂර පහත දැක්වේ.

  **ශ ෂ ස හ ෆ**

  උදා - ශක්තිය, යුෂ, සමය, හරිත, ෆැන්ටා

- **සඤ්ඤක අකුරු** යනුවෙන් හැඳින්වෙන්නේ ස්වරයක හා ව්‍යඤ්ජනයක සංයෝගයට නාසික්‍ය අකුරක් එක්වී සෑදෙන ශබ්ද වේ. සඤ්ඤක අකුරු පහකි.

  ඟ . **ගඟ**
  ඦ . **ඉඦුං**
  ඬ . **හොඬ**
  ඳ . **සඳ**
  ඹ . **අඹ**

- හෝඩිය පෙළ ගැස්වීමේ දී මුලට යෙදෙන අකුරු පදනම් කරගෙන වර්ගාක්ෂර හඳුන්වා ඇත.

| **වර්ගය** | | **අක්ෂර** | | | | |
|---|---|---|---|---|---|---|
| ක | වර්ගය | ක | ඛ | ග | ඝ | ඞ |
| ච | වර්ගය | ච | ඡ | ජ | ඣ | ඤ |
| ට | වර්ගය | ට | ඨ | ඩ | ඪ | ණ |
| ත | වර්ගය | ත | ථ | ද | ධ | න |
| ප | වර්ගය | ප | ඵ | බ | භ | ම |

- **අන්තඃස්ථාක්ෂර** නමින් හැඳින්වෙන්නේ **ය ර ල ව** යන අකුරුයි. ස්වර හා ව්‍යඤ්ජන අතර පිහිටීම නිසා අන්තඃස්ථ යන නම යෙදෙයි.

ව්‍යඤ්ජනයකට එකතුවන ස්වර ශබ්දය නිරූපණය කිරීම සඳහා යෙදෙන සංකේත 'පිලි' නමින් හඳුන්වනු ලැබේ.
උදා - ක් + ආ - කා වශයෙනි.

පිලි හඳුන්වන වගුවක් පහත දක්වා ඇත.

| ස්වර ශබ්දය | පිල්ල | නාමය | නිදසුන |
|---|---|---|---|
| අ | - | - | කවරය |
| ආ | ා | ඇලපිල්ල | කාලය |
| ඇ | ැ | කෙටි ඇද පිල්ල | කැටය |
| ඈ | ෑ | දික් ඇද පිල්ල | කෑදත්තා |
| ඉ | ි | ඉස්පිල්ල | කියත |
| ඊ | ී | දීර්ඝ ඉස්පිල්ල | කීර |
| උ | ු , ු, ු | කෙටි පාපිල්ල | කුමරු පුවත |
| ඌ | ූ , ූ, ූ | දික් පාපිල්ල | කූරා, නූල, රූල |
| ඍ | ෘ | ගැටය සහිත ඇලපිල්ල | කෘතිය |
| ඎ | ෲ | ගැටය සහිත ඇල පිලි දෙක | පිතෲන් |
| එ | ෙ | කොම්බුව | කෙටි |
| ඒ | ේ | කොම්බුව සහ හල් කිරීම | කේතුව |
| ඓ | ෛ | කොම්බු දෙක | කෛලාස |
| ඔ | ො | කොම්බුව හා ඇලපිල්ල | කොටස |
| ඕ | ෝ | කොම්බුව හා හල් ඇලපිල්ල (ඇල පිල්ල සහිත හල් කිරීම) | කෝදුව |
| ඖ | ෞ | කොම්බුව හා ගයනුකිත්ත | කෞමුද |

තවත් ශබ්ද සංකේත කිහිපයක් හඳුනා ගනිමු.

| සංකේතය | නම | නිදසුන |
|---|---|---|
| ්‍ය | යංශය | ව්‍යවස්ථාව |
| ්‍ර | රකාරාංශය | ක්‍රමය |
| ්‍රැ | රකාරාංශය හා කෙටි ඇදය | ධ්‍රැවය |
| ්‍රෑ | රකාරාංශය හා දිගු ඇදය | ක්‍රෑර |
| ර්‍ | රේඵය | කර්‍මය |

නූතන ව්‍යවහාරයෙහි රේඵය වෙනුවට බෙහෙවින් යෙදෙන්නේ " ර් " ය. පහත සඳහන් කරුණු පිළිබඳව ද ඔබගේ අවධානය යොමු කරන්න.

'ඤ' යෙදීම - කොම්පඤ්ඤ වැනි වචනයක ඤ්ඤ අකුරු දෙක එක ළඟ යෙදීමෙන් මුලින් ම යෙදී ඇති ඤ වෙනුවට 'ං' යෙදේ.

උදා - කොම්පඤ්ඤ - කොම්පංඤ, රතිඤ්ඤ - රතිංඤ

'ඞ' යෙදීම - මේ වෙනුවට දැන් බෙහෙවින් යෙදෙන්නේ 'ං' ව යි.

උදා - ලඞ්කාව - ලංකාව
සඞ්ගීතය - සංගීතය

බැඳි අකුරු වෙනුවට හල් අකුරු යෙදීම.

උදා - තත්ත්‍වය - තත්ත්වය
සත්ත්‍වයා - සත්ත්වයා
පක්‍ෂය - පක්ෂය
අන්‍ධකාරය - අන්ධකාරය
බුද්‍ධාගම - බුද්ධාගම

## ක්‍රියාකාරකම 01

**පහත දැක්වෙන වචනවලින් නිවැරදි වචනය තෝරා ලියන්න.**

i. ධර්මිශ්ට / ධර්මිෂ්ඨ / ධර්මිෂ්ට
ii. භීෂණය / භීෂනය / භීශනය
iii. සංදර්ෂනය / සංදර්ශණය / සංදර්ශනය
iv. සීග්‍රගාමී / ශීඝ්‍රගාමී / සීඝ්‍රගාමී
v. මජ්ජිම / මඤ්ජිම / මජ්ඣිම
vi. දක්ෂිණ / දක්ෂින / දක්ශිණ

## ක්‍රියාකාරකම 02

**පහත සඳහන් වචන වරහන් තුළ ඇති නිසි අකුර තෝරා ගෙන සම්පූර්ණ කරන්න.**

i. ය ...... ර්ථය - (ථා / තා)
ii. .......ෂධ - (ඖ / ඔෟ)
iii. කොට් ...... ස - (ටා / ඨා)
iv. පරි ....... ණකය - (ස / ග)
v. ....... න්ද දායක - (ඡ / ච)
vi. පරි ..... ලනය - (ශී / ෂී)
vii. ත්‍යාග ප්‍ර ....... නය - (ධා / දා)
viii. සජ් ....... යනා - (ඣා / ජා)
ix. ............... ක්‍යය - (ෛඑ / ඓ)

## ක්‍රියාකාරකම 03

**පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට සුදුසු නිවැරදි අක්ෂරය යොදා සම්පූර්ණ කරන්න.**

i. දැල්වූ පහ ..... විහිදුවන ආලෝකය සඳකඩ පහ ......ට ද වැටී ඇත. (න / ණ)
ii. හිරු කිර ..... වැටී නිදි කිර ..... මිනිසා නැගී සිටියේය. (න /ණ)
iii. මු .....වලට වී සිටි සිසුහු කඩිනමින් පැමිණ වැඩ මු .....වට සහභාගී වූහ. (ළු /ලු)
iv. ව.....යට පිවිසුණු මිනිසාගේ පයෙහි ලොකු ව.....යක් ඇත. (න/ණ)
v. ග.... වලාවන් නැග එද්දී සඟ ග.....විහාරස්ථානය කරා වැඩියහ. (න /ණ)

## අකාරාදි පිළිවෙළ

දුරකථන නාමාවලි , ශබ්ද කෝෂ, විශ්ව කෝෂ හා පුස්තකාල සුචි ආදි වැදගත් නාම ලේඛන පිළියෙල කිරීමේ දී ඒවා සකස් කරන්නේ අකාරාදි පිළිවෙළට ය.

පහත සඳහන් අකාරාදි පිළිවෙළට දක්වා ඇති ලැයිස්තුව කියවා පැහැදිලි කර ගන්න.

| | | |
|---|---|---|
| අ - අරුණ | ක - කසුන් | ද - දසුනි |
| ආ - ආශා | ඛ - ඛේමා | ධ - ධම්මිකා |
| ඇ - ඇනී | ග - ගයත්‍රී | න - නයන |
| ඈ - ඈන් | ඝ - ඝනානන්ද | ප - පසන් |
| ඉ - ඉසුරි | ඞ - (මූලකුර වශයෙන් නොයෙදේ) | ඵ - ඵුස්සදේව |
| ඊ - ඊවා | ච - චම්පා | බ - බින්දු |
| උ - උදුලා | ඡ - ඡායා | භ - භද්‍රා |
| ඌ - ඌෂා | ජ - ජසින්තා | ම - මයුරි |
| ඍ - ඍෂිදාසි | ඣ - (මූලකුර වශයෙන් නොයෙදේ) | ය - යමුනා |
| ඎ - (මූලකුර වශයෙන් නොයෙදේ) | ඤ - ඤාණවතී | ර - රමණී |
| එ - එලන් | ට - ටයිටස් | ල - ලලිතා |
| ඒ - ඒශාන් | ඨ - ඨකුර් | ව - වජිර |
| ඓ - ඓරාවණ | ඩ - ඩල්සි | ශ - ශක්ති |
| ඔ - ඔලිවර් | ඪ - (මූලකුර වශයෙන් නොයෙදේ) | ෂ - ෂම්මි |
| ඕ - ඕදිරිස් | ණ - ණය | ස - සරලා |
| ඖ - ඖෂධී | ත - තලතා | හ - හරිනි |
| (අ)ං - (මූලකුර වශයෙන් නොයෙදේ) | ථ - ථූපාරාමය | ළ - ළසඳා |
| (අ)ඃ - (මූලකුර වශයෙන් නොයෙදේ) | | ෆ - ෆවුසි |

අකාරාදි පිළිවෙළ නොමැති ව යොදා ඇති පහත සඳහන් වචන අකාරාදි පිළිවෙළට යොදන අයුරු විමසා බලමු .

i. ඉවෝන් , අමිල , ඇනීටා , ඊශා , ආරිය , ඈන්
අමිල , ආරිය , ඇනීටා , ඈන් , ඉවෝන් , ඊශා

ii. පවිත්‍රා , කමලා , දසුන් , තමරා , චම්මි
**කමලා , චම්මි , තමරා, දසුන් , පවිත්‍රා**
iii. සූරතිස්ස , දේවානම්පියතිස්ස , විජය , එළාර , මුටසීව
**එළාර , දේවානම්පියතිස්ස , මුටසීව , විජය , සූරතිස්ස**

එක ම ව්‍යඤ්ජනාක්ෂරයකින් ආරම්භ වන වචනවල දෙවන අකුර අනුව අකාරාදි පිළිවෙළ සකස් කළ යුතු වේ.

සුභානි , සුනේත්‍රා , සුලෝචනා , සුබීතා , සුධීරා
සුබීතා , සුධීරා , සුනේත්‍රා , සුභානි , සුලෝචනා

## ක්‍රියාකාරකම 04

**පහත සඳහන් නාම අකාරාදි පිළිවෙළට සකස් කරන්න.**

i. සරත් , සේනක , සෙනෙවි , සැන්ටින් , සිරිල්
ii. කෑගල්ල , අඹේපුස්ස , ගල්ගමුව , මාතලේ , පැල්පොල
iii. මාලන් , මාධවී , මාපා , මායා , මාදිනී
iv. තිසරි , ගිම්හානි , පසිඳු , කෝකිලා , ටෂ්මා

## ක්‍රියාකාරකම 05

**පහත දැක්වෙන ගම්වල නම් අකාරාදි පිළිවෙළට සකස් කර අභ්‍යාස පොතේ ලියන්න.**

| 01 | | 02 | |
|---|---|---|---|
| | වරකාපොළ | | හම්බන්තොට |
| | ඇතගම | | මන්නාරම |
| | තඹුත්තේගම | | ආටිගල |
| | ඕරුවල | | ඩයගම |
| | ජයන්තිපුර | | දඹාන |
| | සල්ගල | | ඌරාපොළ |
| | රක්වාන | | ඕපනායක |
| | ඉත්තෑපාන | | එරත්න |
| | බණ්ඩාරවෙල | | කඩුවෙල |
| | උඩගම | | ඊරියවැටිය |

## ශබ්ද කෝෂ පරිහරණය

පොත්පත් කියවීමේ දී ඔබට වටහා ගැනීමට අපහසු වචන හමුවෙයි. ශබ්ද කෝෂ පරිහරණය කිරීමෙන් ඔබට ඒවා පහසුවෙන් වටහා ගැනීමට හැකි වේ. වචනවල තේරුම් ශබ්ද කෝෂවල දැක්වේ. සිංහල ශබ්ද කෝෂවල වචන දක්වා ඇත්තේ අ, ආ, ඇ, ඈ, ආදි වශයෙන් අකාරාදි පිළිවෙළට ය.

(මෙහි දැක්වෙන්නේ ශබ්ද කෝෂයකින් උපුටාගත් පිටුවකි.)

**අගුල්ඉද්ද**. අගුළුඉද්ද බ.

**අගුල් කණුව** [නා.] අගුළ සවි වන කණුව: අගුළ දමන කණුව: අගුළ වැටීමට උළුවස්සේ සවි කළ කණුව: මධ්‍යසිංක. 132-35:- 'මේ දොරට අගුල් කණුව නෑ' (කථා.).- අගුළුකණුව බ.

**අගුල්ටැඹ** [නා.]- අගුල්කණුව: සෝරත.

**අගුල් තට්ටුව** (කථා., උඩ.) [නා.] **අ**. ලීවලින් කළ යතුරු කුඩුව: දෙපියන් දොරක සවිකළ කුට්ටම් අගුළ: අගුළ අරින වහන කුර හෝ ඇණය සවි කළ ලී තට්ටුව: යතුරු සහිත යතුරු තහඩුව: 'හුළඟට දොර වැදී දොරේ අගුල් තට්ටුව ගැලවුණා'. - **ආ**. හංවඩු සටහනක්: විහාර ගම්වල ගවයන්ගේ පිටෙහි හංවඩු ගසන අඩයාළම.

**අගුල් දම**නවා, අගුළු දමනවා බ.

**අගුල් දසරු** [නා.ප්‍ර.] අහුල් දසරු වෙ (?) (මධ්‍යලංස. 60 පි. 'අඩිගුල්ලාසාර' බ.): බුත්ස. (සදා.) 293-10: - 'දෙපටවිද්‍යා අගුල් දසරු බාහුදණ්ඩ මුතුවැළ ගලවුනු මැණික්මාලා' පූජා. 118-14.-අහුල් දසරු බ.

**අගුල් දිව**. අගුළු දිව බ.

**අගුල් දෙ**නවා [ක්‍රි.] (විනය.) දිරූ තැන් ඉවත්කොට අලුත් කැබලි දමා මහනවා: අණ්ඩ දමනවා: 'සිදුරු තන්හි අගුල් දෙන්නහු විසින් පැවැත්විය යුතු විධි දක්වන්ට' විනයවිස. (ධ.) 561.

**අගුල්දොර**. අගුළු දොර බ.

**අගුල් පත්** (කථා., දකුණු) [නා. ප්‍ර.] **අ**. බණ අසනවිට හෝ කථාන්තරයක් අසමින් සිටින විට හෝ ඊට දෙන ප්‍රතිවචනය: හිළිව්‍යා: අගුල්පත් තියනවා බ. - **ආ**. වචනයෙන් දෙන අනුබලය: අගුල්පත් දෙනවා ආ බ.

**අගුල් පත් තියනවා** (කථා., දකුණු.) [ක්‍රි.] බණ අසන්නන් අතුරෙන් කෙනකු දේශකයන් වහන්සේට පිළිවදන් දෙනවා: කථාන්තරයක් අසමින් ඊට ප්‍රතිවචන දෙනවා: (යමකුගේ වචනවලට කන් දී ඔහු කියන වචන අනුමත කිරීම පිණිස හෝ ඒ අසා සිටින බව ඇඟවීමට හෝ) හුම්ටි තියනවා: 'උපාසක උන්නැහේ හාමුදුරුවන්ගේ ළඟින් ම වාඩිවී අගුල්පත් තියන්න ඕනෑ'

**අගුල්පත් දෙ**නවා [ක්‍රි.] **අ**. බණ අසන විට දේශකයන් වහන්සේට පිළිවදන් දෙනවා: කථාන්තරයක් ඇසීමේදී ඊට ප්‍රතිවචන දෙනවා: හුම්ටි තියනවා: 'ඒ අනුව..... ඔවුනට අගුල්පත් දෙන සෙස්සනුත් සිනාසුණාය' පූනරා. 22-15. - **ආ**. (කථා., දකුණු.) වචනයෙන් අනුබල දෙනවා: 'හුහක් අය නඩුවට අගුල්පත් දෙනවා බේරෙයි ද කියන්න බෑ .

**අගුල් පොල්ල**. අගුළු පොල්ල බ.

**අගුල් බාව**, අගුළු බාව බ.

**අගුල් බෝලය** (පාරිභා.) [නා.] අගුල ක්‍රියා කරවීමට (අතින් ඇල්ලීම සඳහා අගුලේ සවි කර ඇති) ගෝලාකාර කොටස (- knob): පාරිභා. (හස්ත. 1) 14-4.

**අගුල් යතුර** (කථා.) [නා.] දොරේ අගුල වැසීමට හිර කරන කොටස: 'අගුල් යතුර පන්නලා දෙර ඇරියා'.

**අගුල් ල**නවා, අගුළු ලනවා බ.

**අගුල් වැටෙ**නවා, අගුළු වැටෙනවා බ.

**අගුල් සුත්තර** [නා. බහු.] අගුල්වල ඇති යාන්ත්‍රික කොටස්: යාන්ත්‍රික කොටස් සහිත අගුල් (- locking devices): පාරිභා. (ලෝහක.) 44-21: -'අගුල් සුත්තර ද රබර් සහ ලෝහ වොෂර් ද මනා තත්වයක තබා ගැනීමේත් අවශ්‍යතාව කිවමනා නොවේ' මෝටර් නඩත්. 4-6.

**අගුල් හරි**නවා, අගුළු හරිනවා බ.

**අගුල්හොරේ** (කථා., ලග්.) [නා.] අගුල වැටෙන සිදුර: අගුල් දිව වැටෙන තව්ව: 'අගුල්හොරේ අගුල් දිවේ ගණනට තියෙන්න ඕනෑ'

**අගුව** [නා.] **අ**. ගෙයක පියසි අගින් වැසෙන බිම් කොටස: ගෙබිත්තියෙන් පිට වහල ඇති ප්‍රමාණයේ ඉඩකඩ කොටස: ගේ වටා බිත්තිය අවට භූමි ප්‍රදේශය: ගෙයි පිටිපස: චින්තාමා. 9-35: ශිවළඳ. 14-8: කවිස. 252: වාස්තු. 27-9: මිත්‍රධ. 137-30: - සක්විති. 94-5: 'අගුවේ හෝ ගෙපිළේ හෝ රෑ නිදන්නට යන බල්ලකු' සත්වස. 50-21. - **ආ**. ගෙට යාබද බිම: ගෙමිදුල: රුමල. 179. [**පා**. අග්‍ඝ **සං**. අග්‍ර සස.]

**අගු[2]වඩ**නවා [ක්‍රි.] අගය වැඩි කොට දක්වනවා: වැඩි වටිනාකමක් දක්වනවා: 'දැන් මා මඳක් අවසර නැතැයි අගු වඩන්ට කීය' රත්නා. 643-20.

**අගුළ. අගුල** [නා., ප්‍ර. අගුළු, අගුල්] දොර වසා අවුළුවන ලී කැබැල්ල: දොර වසා තද කිරීමට සවි කළ ලී පෙත්ත: ලීයෙන් හෝ ලෝහයෙන් හෝ තනා දොරේ සවි කළ ඇරෙන වැහෙන දිවත: දෙර වසා අරින්නට බැරි වන

සිංහල ශබ්ද කෝෂය - ප්‍රථම භාගය (පිටුව 93)

## ක්‍රියාකාරකම 06

මෙහි දැක්වෙන ශබ්ද කෝෂ පිටුව උපකාර කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. 'අගුල් හොරේ ' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?
ii. 'හූ මිටි තියනවා' යන අර්ථයට ශබ්ද කෝෂයෙහි යෙදී ඇති වචනය සොයා ලියන්න.
iii. 'අගුව' යන්නට යෙදී ඇති අර්ථය ලියන්න.

## ක්‍රියාකාරකම 07

පහත සඳහන් ශබ්ද කෝෂ ඔබගේ විද්‍යාලයීය පුස්තකාලයෙන් ලබාගෙන ඒ පිළිබඳ ව අධ්‍යයනය කරන්න.

| | | |
|---|---|---|
| සිංහල ශබ්ද කෝෂය | - | සංස්කෘතික දෙපාර්තමේන්තුව |
| ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය | - | වැලිවිටියේ සෝරත නාහිමි |
| ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය | - | ආචාර්ය හරිස්චන්ද්‍ර විජේතුංග |

ඉහත සඳහන් ශබ්ද කෝෂයක් ඇසුරින් පාඩමේ ඇතුළත් මේ වචනවල අර්ථ සොයා ලියන්න.

i. අංගම් මැඩිල්ල
ii. අග්ගස්
iii. අක්පිල්ල
iv. අකුටිලතා
v. අකම්පස
vi. අංගුලිය
vii. අග්නිදාහය
viii. ආඝාත

### පැවරුම්

i. නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළට ලියා දක්වන්න.
ii. ස්වර, වර්ගාක්ෂර, සඤ්ඤක, නාසික්‍ය, මහාප්‍රාණ, අල්පප්‍රාණ, ඌෂ්මාක්ෂර හා අන්තඃස්ථාක්ෂරවලට අයත් අකුරු ලියා පන්තියෙහි බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරන්න.
iii. පන්තියේ ඔබ සිටිනා පේළියෙහි ළමයින්ගේ නම් අකාරාදි පිළිවෙළට සකස් කරන්න.
iv. පොතපත කියවීමේ දී ඔබට හමුවන දුරවබෝධ වචන දහයක අර්ථ ශබ්ද කෝෂයක් ඇසුරින් සොයා බලා අවබෝධ කරගන්න.